# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1843/22 – 2013 දෙසැම්බර් 31 වැනි අඟහරුවාදා – 2013.12.31

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම, මෙයින් ප්‍රකාශ කරමි.

දකුණු පළාතේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, තංගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, නැගෙනහිර ගිරුවාපත්තුව සුළු කොට්ඨාසයේ, රන්න (අ.ග.පි. 328) ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක එච්/ටීඑන්ජී/2009/60 හා 2009.08.12 දිනැති ප්‍රගමන අනුරේඛනයේ පහත සඳහන් නමින් හා ප්‍රමාණයෙන් යුත් ඉඩම් කැබැල්ලට මායිම්:

01. කැබලි අක්ෂර 'ඒ' – කැටන්ගහකොරටුව පල්ලමේඅත්මග සහ පල්ලම – **ප්‍රමාණය: හෙක්. 0.0058ක් පමණ**

උතුරට: කැබලි අංක 79; නැගෙනහිරට: කැබලි අංක 79 සහ මාර්ගය (මා.සං.අ.); දකුණට: මාර්ගය (මා.සං.අ.); බටහිරට: ඇළ.

ජනක බණ්ඩාර තෙන්නකෝන්.
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය.

මගේ අංකය: එල්ඩී/05/2008/එච්ඩබ්/442.
2013 සැප්තැම්බර් මස 30 වැනි දින,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
'මිහිකත මැදුර',
ඉඩම් මහලේකම් කාර්යාලය,
අංක 1200/6, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

01 - 437